# දේශය උදෙසා මැදිහත්වීම
# 2019 සැප්තැම්බර් පළමුවන ඉරුදින

**සුපුවත :**

(අ) හැඳින්වීම :

මැදිහත්වීම යනු තව කෙනෙකු වෙනුවෙන් කරන යාච්ඤාවකි, නැතහොත් ආයාචනයකි. මැදිහත් කරුවෙකු යනු තව කෙනෙකුගේ තැන ගන්නා කෙනෙකි. මැදිහත්වීම අවශ්‍යව සිටින අය උදෙසා ශුද්ධවූ ඇදහිල්ලකින් යුතුව අධෛර්ය නොවී දැඩි වීර්යයෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ කරන ආයාචනයකි.

මේ මොහොත ලක් ඉතිහාසයේ අඳුරුම පැයකි. රටේ පාලකයන් සිටින්නේ රට ගැන, ජනතාව ගැන නොසිතා බලය, ධනය, මානය මුල් කරගෙන තරඟයකයි. අසරණ වනුයේ අහිංසක ජනතාවයි. නිදහස ලැබුනායි සලකන 1948 සිට මේ දක්වා වසර 71ක් ගෙවී ගොසිනි. පාලකයන් මතවාද හා බලකාමය නිසා ජාතීන් ලෙස, ආගම් ලෙස, පංතීන් ලෙස ජනතාව භේද බින්න කර රට විනාශ මුඛයටම ඇද දමා ඇත. පොදු ජනතාව ද (ඔබ හා මම ) සර්ව ජන ඡන්ද බලය ලැබූ දා සිට රට ගැන නොසිතා පක්ෂ, පාට ගැන සලකා පෞද්ගලික වාසි වරම් ගැන පමණක් සිතා මේ පාලකයන් බලයට පත් කිරීමේදී ක්‍රියා කර ඇති ආකාරයට වගකිවයුත්තන් වෙමු.

මේ මොහොත දිවැසිවර ජනතාවක් ලෙස අපගේ යුග මෙහෙවරට බැරෑරුම් ලෙස අවධානය දිය යුතු මොහොතකි. එම දූත මෙහෙවර හුදු හොඳ හිතින් හෝ අපගේ ශක්ති ප්‍රමාණයෙන් පමණක් කළ හැක්කක් නොවේ. ගැඹුරු ආධ්‍යාත්මික බලයකින් ක්‍රියා කළ යුතු මොහොතකි. අප රට පිළිබඳව දෙවියන් වහන්සේගේ ගැළවීමදායක සැළැස්ම අනාවරණය කර ගනිමින් ඔවුන් වහන්සේගේ ගැළවීමේ ක්‍රියාවලියට සහභාගි වෙමින් කටයුතු කිරීමට ඔවුන් වහන්සේ අපව කැඳවන සේක.

දෙවියන් වහන්සේගේ ගැළවීම දායක සැළැස්මට විවෘත වීමට පක්ෂ, පාට ලැදිකමින් අප හිස් විය යුතුයි. මන්ද, අප පක්ෂවලට ඇති බන්ධනය අත් නොහැරියොත් දෙවියන් වහන්සේට ඉඩදීමට නොහැකි බැවිනි. එහි පළමු පියවර මැදිහත්වීමේ යාච්ඤාවයි. අද දිනය මුළු පුබුදු ජනතාව විශාල වශයෙන් එකට එකමුතු වී සිටින්නේ එම කැඳවීම අවබෝධ කරගත් ජනතාවක් නිසයි.

(ආ) මැදිහත්වීමේ යාච්ඤාව පිළිබඳව ශු. ii ජුවාම් පාවුළු මුනිතුමා මෙසේ පවසා ඇත. "දෙවියන් වහන්සේ මිනිසුන්ට ඔවුන්ගේම ගැළවීම පැවරූ සේක. ඔවුන් වහන්සේ මිනිසාට සභාව හා සභාව තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ කාර්යයද පැවරූ සේක. දෙවියන් වහන්සේ සියල්ලන්ටද, පුද්ගලයාටද පූර්ණවම මිනිස් සංහතියට ද පැවරූ සේක. ඔවුන් වහන්සේ මේ සියල්ල එක් අයෙකුටද, එක් අයෙක් සියල්ලන්ට ද පැවරූ සේක. "

දේව ජනතාවක් වශයෙන් ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස දේශය ගැළවීම සඳහා සක්‍රියව මැදිහත්වීමට අපව දෙවියන් වහන්සේ කැඳවන බව අප අවබෝධ කරගත යුතුය. අප අද දිනයේ දේශය උදෙසා යාච්ඤා කළ යුත්තේ එවැනි බරක් සිතේ දරා ගෙනයි. සියළු ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් දේව හඬට සවන් දෙන ජනතාවක් (පුබුදු සංඝයක්) ලෙසද, එක් එක් පුද්ගලයන් ලෙසද දෙවියන් වහන්සේම එය අපට පවරන සේක.

අප රටේ ගැළවීම උදෙසා දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත් වෙමින් ක්‍රියා කිරීමට අපව කැඳවන බව අපි විශ්වාස කළ යුතුය. ශු.සභාව වෙනුවෙන් අපට දිවැසිවර වගකීමක් තිබෙන බව අප සිතට ගත යුතුය. මුළු දේශය උදෙසා ක්‍රිස්තුන් වහන්සේ සමඟ දෙව් පියාණන් ඉදිරියේ පෙනී සිටීමට ඔවුන් වහන්සේගේ හඬට සවන් දීමට, ඒ හඬට කීකරු වීමට අපට ඇරැයුම් කරන සේක.

සාකච්ඡාව :

1. අපේ රටේ විනාශයට පාලකයන් (එදා මෙදා තුර) දායක වී ඇති ආකාරය සාකච්ඡා කරන්න.
2. පෞද්ගලිකව අප එකිනෙකාට ඊට වගකිව යුතුද? ඒ ඇයි සාකච්ඡා කරන්න.
3. මැදිහත්වීම යනු හුදු අවශ්‍යතා ඉල්ලීම් වෙනුවෙන් යාච්ඤා කිරීමට එහා ගිය අරමුණකි. දෙවියන් වහන්සේගේ ගැළවීම දායක සැළැස්මට අවදි වී යාච්ඤා කිරීමයි. සාකච්ඡා කරන්න.
4. අප රට පිළිබඳව දෙවියන් වහන්සේ ගැළවීමදායක සැළැස්ම කුමක්ද? සංකීර්ණ අවදිවීමකට ඇතුල් වන්න.

(ඇ) **යාච්ඤාවේ යොමුව :**

ගැළවීමදායක සැළැස්ම හඳුනාගෙන යාච්ඤා කිරීම හෙවත් දිවැසිවර මැදිහත්වීම යනු අප යාච්ඤා කළයුතු අරමුණ හෙවත් අප මේ මොහොතේ නිශ්චිතව යාච්ඤා කළයුත්තේ කුමක් සඳහාදැයි හඳුනාගන යාච්ඤා කිරීමයි.

* පළමුව අප දේශය යහපත් වීමට ගැඹුරු පදනමක් මත ගොඩනැගුණු දූරදර්ශීව සිතා නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගත යුතුය.

* දෙවනුව ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, ආර්ථිකය පිළිබඳව දේශයේ යහපැවැත්ම උදෙසා ජාතික ප්‍රතිපත්තීන් සකස් කර ගත යුතුය. විශේෂයෙන් දිළිඳු ජනතාව එල්ල කර ගත් සංවර්ධන සැළැස්මක් සකස් කර ගත යුතු ය.

මේ සියල්ලේදී අත්‍යවශ්‍ය සාධකය රටට, ජනතාවට අවංකව ආදරය කරන නායකයෙකුයි. තමා හෝ තම පවුල, පටු වාසි , වරම්, බලය, ප්‍රතිරූපය, ජනප්‍රියභාවය, කීර්තිය අරමුණ කර නොගත් සැබෑ නායකත්වයක අවශ්‍යතාවයයි. එදා මෙදා තුර අප රට මුහුණ දුන් ප්‍රබලම ඛේදවාචකය එවැනි නායකත්වයක අඩුවයි. අපි මොර ගසා සර්වබලධාරී දෙවියන් වහන්සේට කන්නලව් කළයුත්තේ අප රටට නියම නායකයෙක් හා නායකයන් දෙන ලෙසය.

මෙහිදී අපගේ දර්ශනය මෙවර ජනාධිපතිවරණය ජයග්‍රහණය කරවීමම නොවේ. මේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වී සිටින අපේක්ෂකයන්ට අපගේ පෞද්ගලික රුචි අරුචිකම් ආකර්ශණය වීමේ ලැදියාවන්, බන්ධන අප හිස්කර අත්හැරීමට සූදානම් විය යුතුය. අප රට නව දේශයක් කරා මෙහෙයවිය හැකි නායකයෙකු අපට අවශ්‍යයයි. අපගේ දර්ශනය නව දේශයක්. මේ සෑම අතින්ම කුනු වී, ජරා වී ඕජස් ගලන (පාර්ලිමේන්තුවේ සිට කුඩාම සංස්ථාව. ආයතනය දක්වා)සෑම ක්ෂේත්‍රයකම අළුත් වීමක් අපගේ සිහිනය දර්ශනය කර ගනිමු. අප රට නව දේශයක් කරා ගෙන යා හැකි නායකයෙකු අපට අවශ්‍යය ය.

එවැනි තත්ත්වයකට නායකත්වය දිය හැකි නායකයෙකු ඉල්ලා අපි අද දිනයේ යාච්ඤා කිරීමට සූදානම් වෙමු. එකමුතු වෙමු. අධිෂ්ඨාන කර ගනිමු.

**මනස්ස්ථාපන මෙහෙය :**

2වංශාවලිය 7:14 කියවමු.

මැදිහත්වීම ඉතාමත් බලගතු වීමට නම් රහසක් මෙහි තිබේ. පසුතැවිලි වී "නපුරු මාර්ග අත හැරියොත්" මම නුඹේ යාච්ඤාව අසා දේශයට සෙත සලසන්නෙමි. ජාකොබ් තුමා පවසන්නේ "දැහැමි මිනිසෙකු යදින යැදුම බලවත් හා ඵලදායකය" කියාය.

එම නිසා මැදිහත්කරුවා බරපතල පාපයන්ගෙන් නිදහස් වී සිටිය යුතුය. පෞද්ගලික ශුද්ධවන්ත භාවය මැදිහත්කරුවෙකුට අවශ්‍යම ගුණාංගයකි. ඒ සඳහා අවදි වන්න, පසුතැවිලි වන්න හා මනස්ස්ථාපනය වන්න අපව කැඳවන සේක.

පුබුදු ජනතාවක් ලෙස අපට දෙවියන් වහන්සේගෙන් ලැබුනු වසර 4ක මනස්ස්ථාපනයේ කාලය බලගතු මැදිහත් කරුවෙකු වීමට අප සූදානම් කිරීමකි. මේ මාසයේ සැප්තැම්බර් 08 වෙනි දින සිට වසර 4ක මනස්ස්ථාපනයේ දිගුවක් ලෙස නව දේශයක් දකින්නට දින 40ක මනස්ස්ථාපනයේ සමයකට අපට දෙවියන් වහන්සේ ආරාධනා කරන සේක.

මනස්ස්ථාපනය පෞද්ගලික චරිත සෝධනය පමණක් නොවේ. පෞද්ගලික දුර්වලකම් ගැන පමණක් නොවේ. ඉන් අදහස් කරනුයේ පෞද්ගලික පාපය නොතකා හැරිය යුතු බවක් නොවේ. වැදගත් වනුයේ මනස්ස්ථාපනය යන වචනයේ ගැඹුර හා පුළුල් බව අප වටහා ගෙන එම වචනයට කීකරු වීමයි. අප තුළ ගැඹුරු හැරීමකට, පරිවර්ථනයකට පිපාසයෙන් ඉඩ දීමයි.

අප සමිඳාණන්ගේ මංගල දේශනයේ ඉතා බලසම්පන්න වචන ස්වල්පයක් අතරින් බලගතු දේව අනාවරණයකි 'මනස්ස්ථාපනය වන්න' යන වචනය.

**" නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ; දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය; පසුතැවී සිත් හරවා ගන්න. (මනස්ස්ථාපනය වන්න) සුබ අස්න අදහා ගන්න"**

(ශු.මාක් 1:15)

බෙදා ගැනීම :

1. මනස්ස්ථාපනය යන වචනයේ ගැඹුර පිළිබඳව මේ වනවිට ඔබගේ අවබෝධය ගැන සාකච්ඡා කරන්න.
2. මනස්ස්ථාපනය යන වචනය මේ වනවිට ඔබට කර ඇති බලපෑම කුමක්ද?
   මනස්ස්ථාපනය පිළිබඳ ඔබගේ අත්දැකීම බෙදා ගන්න.

**මනස්ස්ථාපනයේ යාච්ඤාව :**

මනස්ස්ථාපනය වීම අපගේ ස්ව ශක්තියෙන් කළහැකි දෙයක් නොවේ, මනස්ස්ථාපනය වීමට අපට ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයත්, කුරුස පාමුල ශ්‍රී රුධීරයේ වරප්‍රසාදයත් සුවිශාල තෑගි දෙකකි. මට / අප සංඝයේ ජනතාවට මනස්ස්ථාපනයට අවංක පිපාසයක් ඉල්ලා අපි යාච්ඤා කළ යුතුයි.

මනස්ස්ථාපනය වීමට තමාගේ පාපයට අවදිවීම හඳුනා ගැනීම, වැදගත් වෙයි. පිළිගත හැක්කේ ; පාප උච්ඡාරණය කළහැක්කේ එවිටයි. දේව රාජ්‍ය උදෙසා කැඳවා ඇති මම කැඳවීමට පටහැනි සෑම සියළු දෙයක්ම පාපයක් බවත් ඉන් හැරීමට පිපාස විය යුතු බවත් දැකිය යුතුය. හැරිය යුතු තැන් පෙන්වා දෙන්න කියා අපි යාච්ඤා කරමු.

පුබුදු ගී අංක 126 "ශුද්ධාත්මයාණෙනි // ...."

ශුද්ධාත්මයාණන් වහන්සේගේ පිහිට උපකාර ඉල්ලමු. මාව පුරවමින්, ස්පර්ශ කරමින් මනස්ස්ථාපනයේ හදවතක්, ආත්මයක් මා තුළ ඇති කරන්න. මගේ රළු මුරණ්ඩු හදවත කඩා මාව අළුතෙන් අඹන්න. මාව/ මගේ පවුල නව මැවිල්ලක් කරන්න. මගේ ප්‍රශංසාගම, සංඝය, මීසම, පුබුදුව, සභාව නව මැවිල්ලක් කරන්න යැයි මනස්ස්ථාපනයේ යාච්ඤාවට ඇතුළත් වෙමු.

පුබුදු ගී අංක 96 "කැමති ලෙසින් ...."

යාච්ඤාව ....

ආත්මාර්ථයේ පාපයේ බේද කිරීමේ අශුද්ධත්වයේ දුෂ්ඨ ආත්ම මගේ ආත්මය සිර කොට බැඳ දමා දේව සැළැස්මට "ආමෙන්" කියන්නට, ඉඩ දෙන්නට බැරි තත්ත්වයක් ඇතිකර තිබේ නම් මාව / අපිව මුදා හරින්න යැයි මොර ගසමු.

පුබුදු ගී අංක 169 "හෙලම් ඔබ වෙත හුස්ම මාගේ..."

යාච්ඤාව .....

කුරුස පාමුලට ගමන් කරමින් භාග්‍යවන්ත අම්මා සමඟ ශ්‍රී රුධීරයේ පවිත්‍රභාවය අත්දකිමින් සුවය, මිදීම ගැළවීම විශ්වාසයෙන් අයිති කර ගනිමු. සැබෑ මනස්ස්ථාපනය වූ හදවතකින් , ආත්මයකින් ස්වර්ගය වෙත එසවෙන මැදිහත්වීමේ යැදුම ඵලදරන බව ඒකාන්තයෙන්ම නව දේශයක බලාපොරොත්තුව ඉටු වන බව විශ්වාසයෙන් ප්‍රශංසා කරමු.

පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ...."

ප්‍රශංසාව.....

**මැදිහත්වීමේ යාච්ඤාවට යොමුව :**

(දිව්‍ය පූජාව තුළ නම් විශ්වාසකයින්ගේ යැදුම ලෙස මේ යාච්ඤාව ඔප්පු කළ හැක)

1. ආදර දෙවි පියාණෙනි,ලෝකයට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට, ලෝකය ශුභාරංචිය වෙතට යොමු කිරීමට ශුද්ධෝත්තම පියතුමාට ද, විශේෂයෙන් අපගේ කාර්දිනල් තුමා සහ රදගුරු මණ්ඩලයට ද, පූජක පැවිදි සැමට ද අප දේශයේ මේ භයානක පැයේ දිවැසිවර ඉදිරිපත් වීමකින් කටයුතු කිරීමට දිවැසිවර ආනුභාවයක් ලැබෙන පිණිස....

2. අප රටේ සියළු ආගමික නායකයින්ට පක්ෂ දේශපාලන ගැති බවින් රට මුදා ගැනීමට විශේෂයෙන් දිළිඳු ජනතාව ගැන අවධානය දී රටට හිතැති නියම නායකයන් ගොඩනැගීමට ධර්මය මත පිහිටා පෙරමුණ ගැනීමට හා එම නායකයන්ව නිවැරදි මාවතට මෙහෙයවීමට අභියෝග කිරීමේ ශක්තිය ලැබෙන පිණිස....

3. ආදර දෙවි පියාණෙනි, ඔබ පුතණුවන් දෙසූ මනස්ස්ථාපනය නමැති බලගතු වචනයට අපි ස්තූති ප්‍රශංසා කරමු. මේ වචනයේ පණිවුඩය අළුත් වීමට අවශ්‍ය නම්, හැරෙන්නට අවශ්‍ය බව අපට ප්‍රකාශ කරයි. නොහැරෙන මනස්ස්ථාපනය වීමට සූදානම් නැති මිනිසෙකුට රටක්, සමාජයක්, ආයතනයක්, පවුලක්, සංඝයක් අළුත් කළ නොහැක. එම නිසා මේ මනස්ස්ථාපනය වන්න යන වචනය අප දේශය පුරා රාව ප්‍රතිරාව නංවමින් "ඵල දරණ" වචනයක් වන පිණිස...

4. ආදර දෙවි පියාණෙනි, කුඩාම කුඩා කූඹින්ගේ සිට මහා විශාල සතුන් දක්වා සෑම ජීවියෙකුටම ඔබ වහන්සේ නායකයෙකු පත්කර ගැනීමට සැළසුම් කොට තිබේ. අප රට අයාලේ යන්නේ, කඩා වැටෙන්නේ, ජනතාව දිළිඳු වී අසරණ වී දුක් විඳින්නේ, ගැඹුරු ආදරයකින් මුළු දේශයම වැළඳ ගන්නා නායකයන් නැති නිසයි. අපිට එවැනි නායකයන් දෙන ලෙස තාත්තේ අපි ඔබ වහන්සේට මොර ගසා යාච්ඤා කරමු. .....

5. ආදර දෙවි පියාණෙනි, ස්වාමි තාත්තා හා ආධ්‍යාත්මික අධ්‍යක්ෂක පියතුමන් වන රොබින්සන් පියතුමා, දිවැසි එකතුව ඇතුළු සියළු පුබුදු නායකත්වයන්, මුළු පුබුදු ජනතාව ආශිර්වාද කරන්න. ශ්‍රී ලාංකික කිතු දන පුබුදුව සතු සුවිශේෂ අනන්‍යතාව වන සරල චාම් ජීවිතය, පවතින සමාජ රැල්ලට ආගමිකවත්, සමාජීයවත් යට නොවී සැබෑ දිවැසිවර අනන්‍යතාවයේ මුද්‍රාවක් වීමට එදා මෙදා තුර ඔබ වහන්සේ අප ආලේප කළ සේක. යක්ෂයාට හා අපගේ පෞද්ගලික මතිමතාන්තරවලට.අරමුණු වලට. අපේක්ෂා වලට මේ මහා දිවැසිවර ආලේපය සොරකම් කිරීමට, විනාශ කිරීමට ඉඩ නොදී දිවි හිමියෙන් එය රැක ගැනීමට ඒ උදෙසා කැපවෙමින් ගමනක් යෑමට අපට බහුලව දේවාශිර්වාදය ලැබෙන පිණිස....